# <u>නැගෙනහිර පළාත් සභාව.</u>

## <u>2012 වර්ෂය සඳහා කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීම.</u>

නැගෙනහිර පළාත් සභාව මගින් 2012 වර්ෂය සඳහා ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු සඳහා කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් කැඳවනු ලැබේ.

### <u>කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය සුදුසුකම්.</u>

01) ICTAD ආයතනයේ නිර්මාණ කරුවෙකු ලෙස ලියාපදංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් (රුපි.මිලියන පහ) රු:5,000,000/= දක්වා වන කුඩා පරිමාණ කොන්ත්‍රාත්තු වැඩ සඳහා තමා ලියාපදිංචි කිරීමට හිමිකම් ලබති. තවද එම ආයතනයේ ලියාපදිංචි කරගෙන සිටින සමිතින් රුපි(මිලියනයක්) 1,000,000/= දක්වා වන කොන්ත්‍රාත් වැඩකිරීමේ සුදුසුකම් ලබන්නෝය.

02) සිවිල් ඉංජිනේරු වැඩකටයුතු හසුරුවා ගැනිමේ සුදුසුකම් සතුකරගෙන ඇතොත් එය සනාථ කිරීමට හැකි ලියකියවිලි ඉදිරිපත් කර යුතුය. (අයදුම් පත්‍රය සමඟ එම පිටපත ඇමිණිය යුතුය)

03) තමාගේ සුදුසුකම් හා වත්කම් සනාථ කරන්නාවු ලිඛිත සාක්ෂින් ඉදිරිපත් කළ යුතුය. (ඒවායේ පිටපත් අයදුම් පත්‍රය සමඟ යාකර එවිය යුතුය)

### <u>අයදුම්පත්‍රය සහ ලියාපදිංචිය.</u>

ලියාපදිංචි කිරීම සඳහා ආපසු ගෙවනු නොලබන පහත සඳහන් මුදල් ගෙවීම් අවශ්‍ය වේ.

1) රුපි. මිලියන 1,000,000/= ට අඩු මුදලට = රු:1000.00

2) රුපි. මිලියන 1,000,000/= හා රුපි. මිලියන 2,000,000/= ට අතර වන මුදලට = රු:2000.00

3) රුපි. මිලියන 2,000,000/= සිට රුපි. මිලියන 5,000,000/= දක්වා වන මුදලට = රු:3000.00

### <u>කොන්දේසින්</u>

1) කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචිය 2012 වර්ෂය සඳහා පමණක් බලසහිතව පවතියි. ලියාපදිංචි කළ කොන්ත්‍රාත්කරුවන් අතරින් මිළ ගණන් කැඳවනු ලැබේ. කෙසේ වෙතත් වෙනත් ක්‍රමවේදයන් මගින් මිල ගණන් කැඳවීමේ අයිතිය සේවා ලාභියාට හිමිය.

2) ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත් තක්සේරු හා ඇගයීම්වලට ලක්කරනු ලබන අතර, ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර තිබීම පිළිබඳව හෙළිවුවහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3) ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන කුමන හෝ අයදුම්පත්‍රය කිසිදු කාරණා ගැන සැළකිල්ලට නොගෙන පිළිගැනීමට හෝ ප්‍රතික්ෂප කිරීමට අදාල අයිතිය ප්‍රධාන ලේකම්තුමා සතුය.

4) ලියාපදිංචි කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවන් මිල ගණන් කැඳවීම් වලදී නිවැරදි අයුරින් මිල ගණන් සඳහන් කරන්නට අපොහොසත් වන්නේ නම් හෝ නියමිත කාලය තුළ පවරන ලද වැඩ නිමකිරීමට නොහැකි වුවහොත් ඊට බලපාන කොන්දේසින් අනුව කොන්ත්‍රාත් කරුවන්ගේ නම් ලියා පදිංචි ලේඛණයෙන් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

5) තමාගේ වෙළඳ ලියාපදිංචියේ සඳහන් ක්ෂත්‍රයට අදාල කාර්යයන් සඳහා පමණක් කොන්ත්‍රාත් කරුවන් තම ලියාපදිංචිය සිදුකළ හැකිය.

6) ලියාපදිංචිකළ සම්තින් රුපි.මිලියන 1,000,000/= කට නොවැඩි කොන්ත්‍රාත් වැඩ භාරගත හැකිය.

7) කොන්ත්‍රාත් වැඩවල නිරතවීමට තමා කැමති දිස්ත්‍රික්කයන් ගැන කොන්ත්‍රාත් කරුවන් සඳහන් කළ යුතුය.

8) ලියාපදිංචි කිරීම් සඳහා අවශ්‍ය අයදුම් පත් මෙහි ලබා දී ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව තමා විසින්ම සකස් කරවා ගෙන ලියාපදිංචි වෙළඳ සහතිකයේ සහතික කළ පිටපතක් හා ආපසු නොගෙවනු ලබන ලියාපදිංචි ගාස්තු බැංකුවේ ගෙවන ලද බැංකු කුවිතාන්සිය ද සමග "නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) නැගෙනහිර පළාත, කන්නියා පාර, වරෝදය නගර්, ත්‍රිකුණාමලය" යන ලිපිනයට 2012.01.16 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ එවනු ලබන තැපැල් කවරයේ වම් කෙළවරේ "2012 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියා පදිංචි කිරීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවීම අවශ්‍ය වේ.

9) නැගෙනහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) ගේ මහජන බැංකු ගිණුම් අංක 066-1-001-6-7200559 ට ආපසු නොගෙවනු ලබන තැන්පත් මුදල් බැර කළ යුතු අතර, එම කුවිතාන්සිය අයදුම් පත්‍රය සමග ඇමුණුම් කළ යුතුය.

10) 2012.01.16 වැනි දින ප.ව 3.00 ට පසු ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11) අමතර තොරතුරු පහසුවෙන් ලබාගැනීමට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) ගේ අංක 026-2224852 / 026-2222206 යන දුරකථනයන් වලට කථාකරමින් හෝ www.ep.gov.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් සම්බන්ධතා ඇතිකර ගනිමින් දැන ගත හැකිය.

**<u>ඉදිකිරීමේ කොන්ත්‍රාත්.</u>**

- ගොඩනැගිලි ඉදිකිරීම්, අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම.
- මාර්ග ඉදිකිරීම් හා අළුත් වැඩියාවන්.
- වාරිමාර්ග වැව්වල අමුණු හා බැම්ම සහ ඇළ මාර්ගවල් ඉදි කිරීම් හා අළුත් වැඩියා කිරීම්.
- කාණු පද්ධතීන් හා ඊට අදාළ ඉදිකිරීම්.
- භූදර්ශන වැඩකටයුතු (Land Scape)
- අභ්‍යන්තර සැරසිලි.

**වී.පී. බාලසිංහම්,**
**ප්‍රධාන ලේකම්,**
**නැගෙනහිර පළාත.**

# <u>ආදර්ශ අයදුම් පත්‍රය.</u>

## <u>2012 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

## <u>නැගෙනහිර පළාත් සභාව.</u>

01) වෙළඳාමේ නම :-........................................................

02) වෙළඳාමේ ලිපිනය :-........................................................

03) දුරකථන අංකය :-........................................................

04) ෆැක්ස් අංකය :-........................................................

05) වෙළඳාමේ ලියාපදිංචි අංකය :-........................................................

06) වෙළඳාමේ ස්වභාවය :-........................................................

07) ඉදිකිරීම් ක්ෂේත්‍ර :-........................................................

08) බැංකුවේ නම :-........................................................

09) ණය පහසුකම් කාලසීමාව :-........................................................

10) වැඩ කටයුතු භාරගැනීමට කැමති දිස්ත්‍රික්කය :-........................................................

11) VAT ලියාපදිංචිය තිබේ නම් අංකය :-........................................................

12) වෙනත් තොරතුරු :-........................................................

මා/අප විසින් ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බවත්, නැගෙනහිර පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් විස්තර කර ඇති කොන්දේසින්වලට අනුව ඉදිකිරීම් කටයුතු කළ හැකි බවත්, සහතික කරන අතර, ලියාපදිංචි ගාස්තුවක් වශයෙන් රුපියල් .............................. මුදල් ත්‍රිකුණාමලය, මහජන බැංකු ශාඛා ගිණුමට බැර කරමින් ලද බැංකු කුවිතාන්සිය මෙයට යාකර එවමි.

| | | |
|---|---|---|
| ...................................... | ...................................... | ...................................... |
| අයදුම්කරුගේ අත්සන | අයදුම්කරුගේ නම | දිනය |